**මාවතගම ප්‍රාදේශීය සභාව - 2023**

**-----------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

මාවතගම ප්‍රාදේශීය සභාවේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්ති වලට අදාළ තොරතුරුද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උප වගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට මාවතගම ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළ කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාශර්වයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන්, ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේ දී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව, විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී, වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති වීමේ අවදානම් හඳුනා ගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟ හැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකි වන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වා ගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාල සීමාවන් තුළ සහ අදාළ නීති,රීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

**1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳව වාතර්ාව**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

**1.6 මූල්‍ය ප්‍රකාශන**

**1.6.1 ගිණුම්කරණ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණය | ලේකම්ගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ ලැබිය යුතු ස්ථාවර තැන්පත් පොළී රු.890,459 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | ඉදිරියේදී නිවැරදිව ගණනය කිරීම කරන බව. | නිවැරදිව ගිණුම් තැබීම කළ යුතුයි. |
| (ආ) | සමාලෝචිත වර්ෂය තුළ ගෙවූ පොලී, ලාභාංශ හා ප්‍රසාද මුදල් ගෙවීම් රු.69,220 ක් මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි. | ආදායම් වියදම් ගිණුමට සටහන් කිරීමට අතපසු වී ඇත. ලෙජර ගිණුම් පිළියෙල කිරීමේදී එය ලෙජරයට පිටපත් කර ඇති බව. | නිවැරදිව ගිණුම් තැබීම කළ යුතුය. |
| (ඇ) | සභාව විසින් බාහිර ආයතනයකට පවරා දී තිබූ වටිනාකම රු.215,000 ක් වූ ඉඩම් 02 ක් ජංගම නොවන වත්කම් තුළ දක්වා තිබුණි. | නිසි ක්‍රමවේදයට අනුව ඉඩම් ලේඛනයෙන් බැහැර කිරීමට කටයුතු කරන බව. | නිවැරදිව ගිණුම් තැබීම කළ යුතුය. |
| (ඇ) | වටිනාකම රු.200,000ක් වූ ඉඩමක් මූල්‍ය ප්‍රකාශනයේ අවසන් ගිණුමට රු.2,000,000 ක් ලෙස දක්වා තිබුණි. | වටිනාකම ලබා දීමේදී සිදු වූ දෝෂයක් බවත් ඉදිරියේදී නිවැරදි කර ගැනීමට කටයුතු කරන බව . | -එම-. |

| | | | |
|---|---|---|---|
| (ඉ) | වටිනාකම රු.18,590,000 ක් වූ ඉඩම් දෙවරක් ගිණුම්ගත වී තිබුණි. | ඉදිරියේදී නිවැරදි කර ගැනීමට කටයුතු කරන බව. | -එම- |
| (ඊ) | සිරිමාවෝ බණ්ඩාරණායක පෙර පාසලේ ආරක්ෂිත වැටෙහි වටිනාකම රු.2,000,000 කින් අඩුවෙන් ගිණුම්ගත වී තිබුණි. | වටිනාකම ලබා දීමේදි සිදු වූ දෝෂයක් බව. | -එම- |
| (උ) | සමාලෝචිත වර්ෂය තුළ ආයුර්වේද මධ්‍යස්ථාන ගොඩනැගිල්ල වැඩි දියුණු කිරීම හා මාවතගම පොදු වෙළඳපල සංකීර්ණයේ වැසිකිලි පද්ධතිය අලුත්වැඩියා කිරීම වෙනුවෙන් දැරූ එකතුව රු.1,464,579 ක් ප්‍රාග්ධනිත කර නොතිබුණි. | නිවැරදි කිරීම් සිදු කිරීමට කටයුතු කරන බව. | -එම- |
| (ඌ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ස්ථාවර තැන්පතු වටිනාකම රු.7,529,060ක් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | 2024 වසරේ අවසන් ගිණුමෙන් නිවැරදි කිරීම් කරන බව. | -එම- |
| (එ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට විශ්‍රාම වැටුප් අරමුදලෙහි වටිනාකම රු.372,473 ක් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | -එම- | -එම- |
| (ඒ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පළාත් පාලන දෙපාර්තමේන්තුවෙන් ලැබිය යුතු රු.497,000 ක් ගිණුම්ගත කර නොතිබුණි. | 2024 වසරේ අවසන් ගිණුමෙන් නිවැරදි කිරීම් කරන බව. | නිවැරදිව ගිණුම් තැබීම කළ යුතුය. |

**1.6.2 නොසැසඳුණු පාලන ගිණුම**

| | විගණන නිරීක්ෂණය | ලේකම්ගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන එකතුව රු.424,680,555 ක් වූ ගිණුම් විෂයන් 05 කට අදාළ ශේෂයන් හා උප ලේඛනවල දැක්වෙන ශේෂ අතර රු.1,852,076 ක වෙනසක් විය. | ඉදිරියේදී අදාල නිවැරදි කිරීම් කරන බව. | වෙනස්කම්වලට හේතු හඳුනාගෙන නිවැරදි කිරීමට කටයුතු කළ යුතුයි. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන එකතුව රු.3,921,950ක් වූ ගිණුම් විෂයන් 09 කට අදාළ ශේෂයන් හා ස්ථාවර වත්කම් ලේඛනයේ දැක්වෙන ශේෂ අතර රු.9,302,000 ක වෙනසක් විය. | - එම - | වෙනස්කම් වලට හේතු හඳුනාගෙන නිවැරදි කිරීමට කටයුතු කළ යුතුයි. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන එකතුව රු.67,750,000 ක් වූ මෝටර් රථ හා කරත්ත 20 කට අදාළ ශේෂයන් හා ස්ථාවර වත්කම් ලේඛනයේ දැක්වෙන වටිනාකම අතර රු.37,632,235 ක වෙනසක් විය. | ඉදිරියේදී ස්ථාවර වත්කම් ලේඛනය නිවැරදි කිරීමට කටයුතු කරන බව. | වෙනස්කම් වලට හේතු හඳුනාගෙන නිවැරදි කළ යුතුයි. |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන තුළ දැක්වෙන එකතුව රු.144,753ක් වූ පුස්තකාල 08 ක පොත් ඉවත් කිරීමේ වටිනාකම හා අපහරණ භාණ්ඩ සමීක්ෂණ වාර්තාවට අනුව වටිනාකම අතර රු.82,938 ක වෙනසක් නිරීක්ෂණය විය. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | වෙනස්කම් වලට හේතු හඳුනාගෙන නිවැරදි කළ යුතුයි. |

### 1.6.3 විගණනය සඳහා අවශ්‍ය තොරතුරු ඉදිරිපත් නොකිරීම

| විගණන නිරීක්ෂණය | ලේකම්ගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අවශ්‍ය තොරතුරු ඉදිරිපත් නොකිරීම හේතුවෙන් එකතුව රු.91,949,720 ක් වූ ගිණුම් විෂයයන් 14 ක් විගණනයේ දී සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකි විය. | අවශ්‍ය තොරතුරු ඉදිරියේදී ලබාදීමට කටයුතු කරන බව. | නොපමාව අදාල තහවුරු ඉදිරිපත් කළ යුතුය. |

## 1.7 අනුකූල නොවීම

### 1.7.1 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම.

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නිති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම | ලේකම්ගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජන රජයේ මුදල් රෙගුලාසි | | | |
| (i) | මු.රෙ. 371(3) | වටිනාකම රු.110,894 ක් වූ අත්තිකාරම් දෙසැම්බර් 31 දින වන විටත් පියවීමට කටයුතු කර නොතිබුණි. | ඉදිරියේදී නිරවුල් කිරීමට කටයුතු කරන බව. | දෙසැම්බර් 31 දිනට අත්තිකාරම් ගිණුම නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ii) | මු.රෙ.1645(අ) | වාහන ලොග් සටහන් පොත් යාවත්කාලීන කර නොතිබුණි. | ඉදිරියෙදී නියමිත ආකෘති පත්‍රයට අනුව සටහන් කිරීමට කටයුතු කරන බව. | යථෝක්ත මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (iii) | මු.රෙ.1646 | වාහන 03 ධාවන සටහන්පත් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | ධාවන සටහන් සියල්ල ඉතා කඩිනමින් ඉදිරිපත් කරන බව. | යථෝක්ත මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ | | | |
| (i) | 2002 පෙබරවාරි 25 දිනැති අංක 01/2002 දරන චක්‍රලේඛය | සභාව සතු වාහන 18 ක ආයතනයේ නම සමඟ රාජ්‍ය ලාංඡනය සලකුණු කර නොතිබුණි. | ඉදිරියේදී සභාව සතු වාහනවල රාජ්‍ය ලාංඡනය සහ ආයතනයේ නම පිංතාරු කිරීමට කමිටු අනුමැතිය ගෙන සිදු කරන බව. | රාජ්‍ය ලාංඡනය සමඟ ආයතනයේ නම සළකුණු කිරීමට කටයුතු කළ යුතුය. |
| (ii) | 2016 දෙසැම්බර් 29 වන දිනැති අංක 30/2016 දරන චක්‍රලේඛයේ 3(1) ඡේදය. | ප්‍රාදේශීය සභාවට අයත් වාහන 16 ක් සම්බන්ධයෙන් චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | පළාත් පාලන යාන්ත්‍රික ඉංජිනේරුතුමන් දැනුවත් කර මේ වන විට වාහන කිහිපයක ඉන්ධන දහන පරීක්ෂාව සිදු කර ඇති බවත් අනෙකුත් වාහන සඳහා එතුමන් සහභාගී කර ගනිමින් සිදු කිරීමට කටයුතු කරන බව. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචන

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.18,481,614 ක් වූ අතර ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.6,042,306 ක් විය.

## 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම් රැස්කළ ආදායම් හා ,බිල්කළ ආදායම් ,හිඟ ආදායම්

ලේකම්වරයා විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තු ගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2023 වර්ෂය | | | | 2022 වර්ෂය | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 |
| වරිපනම් හා බදු | 3,911 | 3,911 | 2,646 | 8,371 | 5,110 | 5,130 | 3,947 | 7,107 |
| කුලී | 3,801 | 10,339 | 10,513 | 852 | 8,670 | 9,323 | 10,513 | 1,025 |
| බලපත්‍ර ගාස්තු | 500 | 500 | 640 | - | 600 | 217 | 217 | - |
| වෙනත් ආදායම් | 35,050 | 35,050 | 12,220 | 25,277 | 110,231 | 167,636 | 167,636 | 2,447 |
| **එකතුව** | 43,262 | 49,800 | 26,019 | 34,500 | 124,611 | 182,306 | 182,313 | 10,579 |

### 2.2.2 ආදායම් රැස් කිරීමේ කාර්යසාධනය

| | විගණන නිරීක්ෂණය | ලේකම්ගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ බිල්කළ ආදායම රු. මිලියන 49 ක් වූ අතර පෙර වර්ෂයන්ට අදාලව හිඟ ආදායම් ලැබීම්ද ඇතුළුව රු. මිලියන 26 ක් සමාලෝචිත වර්ෂයේ රැස්කර තිබුණි. සමාලෝචිත වර්ෂය අවසානයේදී රු. මිලියන 34 ක් තව දුරටත් අයකර ගැනීමට පැවතුණි. | අයකර ගැනීමට කටයුතු කරමින් පවතින බව. | නොපමාව හිඟ මුදල් අයකර ගැනීමට ක්‍රියා කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ ආරම්භයට රු.7,106,829ක වරිපනම් හා බදු හිඟයෙන් රු.5,469,681 ක මුදලක්ද, බිල්කිරීම් රු.3,910,669ක මුදලින් රු.2,901,453 ක මුදලක්ද අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | හිඟ මුදල් ඉතා කඩිනමින් අයකර ගැනීමට කටයුතු කරන බව. | නොපමාව හිඟ මුදල් අයකර ගැනීමට ක්‍රියා කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.600,937 ක හිඟ අක්කර බදු මුදලක් විය. | නොගෙවන බදු හිමියන් පිළිබඳව සමීක්ෂණ මණ්ඩලයක් වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව. | නොපමවෙ හිඟ මුදල් අයකර ගැනීමට ක්‍රියා කළ යුතුය. |
| (ඈ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට කඩ කුලී හා වත්කම් බදු දීම් හිඟය රු.756,972 ක මුදලක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | ඉදිරියේදී අයකර ගැනීමට කටයුතු කරන බව. | නොපමාව හිඟ මුදල් අයකර ගැනීමට ක්‍රියා කළ යුතුය. |
| (ඉ) | පළාත් සභාවේ ලේකම්වරයාගේ සහ අනෙකුත් බලධාරීන්ගෙන් 2023 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ උසාවි දඩ සහ මුද්දර ගාස්තු පිළිවෙලින් රු.229,208 ක් හා රු.73,102,407ක් විය. | උසාවි දඩ හා මුද්දර ගාස්තු අයකර ගැනීමට කටයුතු කරන බව. | අදාළ ආයතන දැනුවත් කර හිඟ මුදල් ගෙන්වා ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඊ) | සමාලෝචිත වර්ෂය සඳහා ත්‍රී රෝද රථ බලපත්‍ර ගාස්තු ලෙස 182 දෙනෙකුගෙන් රු.136,500 ක් අයකර ගැනීමට සභාව කටයුතු කර නොතිබුණි. | බලපත්‍ර ලබා නොගෙන ඇති ත්‍රීරෝද රථ පිළිබඳව සොයා බලා බලපත්‍ර දීමට කටයුතු කරන බව. | නොපමාව ලැබිය යුතු ආදායම් අය කර ගැනිමට කටයුතු කළ යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 පනතින් පවරා ඇති කාර්යයන් ඉටුකිරීම.

**සන අපද්‍රව්‍ය කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | ලේකම්ගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| පසුගිය වසරට සාපේක්ෂව සමාලෝචිත වර්ෂය තුළ කොම්පෝස්ට් නිෂ්පාදනය හා අලෙවියෙන් ලද ආදායම පිළිවෙලින් සියයට 44 ක් හා සියයට 52 කින් අඩු වී තිබුණි. | ප්‍රජාවගෙන් පොහොර සඳහා ලැබුණ ඉල්ලුම අඩු වී ඇති බව. | ආදායම් වැඩිකර ගැනීමට කටයුතු කළ යුතුය. |

### 3.2 කළමනාකරණ ආකාරයක්ෂමතා

| විගණන නිරීක්ෂණය | ලේකම්ගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය අවසාන වන විට විශ්‍රාම යෑම / ස්ථාන මාරුවීම වැනි කරුණු හේතුවෙන් නිලධාරීන් 14 දෙනෙකුගෙන් රු.299,243 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | අය කර ගැනීමට කටයුතු කරමින් සිටින බව. | නොපමාව ණය මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

## 3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | ලේකම්ගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අක්කර 03 රූඩ් 03 පර්චස් 31.3 කින් යුත් මැටිබොක්ක සනී සයිඩ් වත්තේ ඇස්තමේන්තු විකුණුම් වටිනාකමෙන් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 154(1) වගන්තිය ප්‍රකාරව අයකළ යුතු සියයට 1 බද්ද රු.1,258,520 ක් වූ අතර විගණිත දිනය වන විට ඉන් රු.758,520 ක් හිඟව පැවතුණි. | හිඟ බදු ගෙවීම් මුදල් අය කර ගැනීමට අදාල ආයතනයට ලිඛිතව දැනුම් දෙන බව. | නොපමාව බදු මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

## 3.4. නිෂ්කාර්ය හෝ ඌණ උපයෝජිත දේපල, පිරියත හා උපකරණ

| | විගණන නිරීක්ෂණය | ලේකම්ගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සභාව සතු කැබ් රථයක් හා ට්‍රැක්ටර් ට්‍රේලරයක් අපහරණය කිරීම සඳහා පිළිවෙලින් 2015 හා 2019 වර්ෂවල හඳුනාගෙන තිබුණද සමාලෝචිත වර්ෂයේද එම වාහන අපහරණය කර නොතිබුණි. | අපහරණය කිරීමට කටයුතු කරන බව. | නොපමාව අපහරණය කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | සභාව සතු ට්‍රැක්ටරයක්, ත්‍රීවිලයක්, මෝටර් සයිකලයක් හා ට්‍රැක්ටර් ටේලරයක් මාස 04 සිට වර්ෂ 02 අතර කාලයක සිට අක්‍රීයව පවතින අතර, එම වාහන අලුත්වැඩියා කර නැවත භාවිතයට ගැනීමට හෝ අපහරණය කිරීමට අවශ්‍ය කටයුතු සිදුකර නොතිබුණි. | අලුත්වැඩියා කිරීමට හෝ අපහරණය කිරීමට කටයුතු කරන බව. | නොපමාව අලුත්වැඩියා කිරීමට හෝ අපහරණය කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | 2004 වර්ෂයේදී පරිත්‍යාගයක් ලෙස ලැබී තිබූ කම්පැක්ටර් රථයේ අයිතිය සභාව වෙත පවරාගෙන නොතිබුණු අතර, රථය දීර්ඝ කාලයක සිට ප්‍රයෝජනයකට නොගෙන සභා භූමිය තුළ අබලන්ව පැවතුණි. | රථයේ කිසිදු ලියවිල්ලක් හෝ එම වාහනයේ පොත සභාවට නොලැබීම නිසා හා වෙනත් ආයතනයක වාහනයක් නඩත්තු කිරීමට නොහැකි වීම නිසා රථ ගාලේ ගාල් කර ඇති බව. | නොපමාව අපහරණය කිරීමට හෝ අදාළ ආයතන වෙත ආපසු භාරදීමට හෝ කටයුතු කළ යුතුය. |

### 3.5 වත්කම් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | ලේකම්ගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සභාව සතු මෝටර් රථ කරත්ත තුළ ඇතුළත් රු.163,340 ක් වටිනා කසල කරත්ත / අත් කරත්ත 05 ක් හා පා පැදි 02 ක් භෞතිකව නොමැති බවට නිරීක්ෂණය විය. | මෙම අත්කරත්ත සහ පාපැදි පිළිබඳව සොයා බලා ඉදිරි කටයුතු කරන බව. | භෞතිකව පැවතීම පිළිබඳව සොයා බලා ඒ අනුව ඉදිරි කටයුතු කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂය තුළ සභාව අත්පත් කර ගත් ඉඩම් කට්ටි 06 කට අදාළ එකතු වටිනාකම රු.39,210,000 ක් ස්ථාවර වත්කම් ලේඛනයට ඇතුළත් කර නොතිබුණි. | අදාළ ඉඩම් කට්ටි 06 ස්ථාවර වත්කම් ලේඛනයට ඇතුලත් කිරීමට කටයුතු කරන බව. | නොපමාව ස්ථාවර වත්කම් ලේඛනයට ඇතුලත් කළ යුතුය. |
| (ඇ) | සමාලෝචිත වර්ෂය තුළ සභාව මිලදී ගත් ලී බඩු උපකරණ හා යන්ත්‍ර උපකරණ වටිනාකම පිළිවෙලින් රු.402,900 ක් හා රු.168,450 ක් ඉන්වෙන්ට්‍රි ලේඛනයට ඇතුළත් කර නොතිබුණි. | ඉදිරි භාණ්ඩ සමීක්ෂණ වාර්තාවට අනුව ඉන්වෙන්ට්‍රියට ඇතුලත් කර ගැනීමට කටයුතු කරන බව. | නොපමාව ඉන්වෙන්ට්‍රි ලේඛනගත කළ යුතුය. |
| (ඈ) | වෙනත් ආයතනවල නමට ලියාපදිංචි වී ඇති සභාව පරිහරණය කරනු ලබන වාහන 04 ක අයිතිය සභාව වෙත පවරා ගැනීමට සමාලෝචිත වර්ෂය වන විටත් කටයුතු කර නොතිබුණි. | පවරා ගැනීමට කටයුතු කරමින් සිටින බව. | නොපමාව පවරා ගැනිමට කටයුතු කළ යුතුය. |

## 4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

### 4.1 අරමුණුවලින් බැහැර ක්‍රියාකාරකම්

| | විගණන නිරීක්ෂණය | ලේකම්ගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම අනුව (කර්මාන්ත අංශයේ ආංශික සැලැස්ම) ඉටු කළ යුතු ව්‍යාපෘති 17 න් ව්‍යාපෘති 15 ක් ඉටුකර නොතිබුණු අතර, ඒ සඳහා වාර්ෂික අයවැය මඟින් රු.94,200,000 ක ප්‍රතිපාදන සලසා තිබුණි. | රාජ්‍ය මුදල් පාලනය කිරීම පිළිබඳ වූ චක්‍රලේඛන නිසා සැලසුම් කළ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට නොහැකි වූ බව. | ක්‍රියාකාරී සැලැස්මට අනුගතව සභාවේ කටයුතු මෙහෙයවීමට ක්‍රියා කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම අනුව (ප්‍රජා සංවර්ධන අංශයේ ආංශික සැලැස්ම) ව්‍යාපෘති 11 ක් ඉටුකළ යුතුව තිබුණත් ඉන් ව්‍යාපෘති 06 ක් ඉටුකර නොතිබුණු අතර, ඒ සඳහා වාර්ෂික අයවැය මඟින් රු.11,000,000 ක ප්‍රතිපාදන සලසා තිබුණි. | සභා අරමුදලෙහි මුදල් ප්‍රමාණවත් නොවීම නිසා ව්‍යාපෘතීන් ක්‍රියා කිරීමට නොහැකි වූ බව. | ක්‍රියාකාරී සැලැස්මට අනුගතව සභාවේ කටයුතු මෙහෙයවීමට ක්‍රියා කළ යුතුය. |